# ඇබෑර්තු

# ඒකාබද්ධ ජලාධාර හා ජලසම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

# වාරිමාර්ග අමාත්‍යාංශය

IWWRMP

ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) ලෝක බැංකුව විසින් අරමුදල් ප්‍රතිපාදිත වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් වන අතර, එය 2026 ඔක්තෝබර් 31 වෙනි දින වන විටදී සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපෘතියකි.

2019.03.15 දනම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 01/2019 දරන චක්‍රලේඛය පරිදි හා රජයේ බඳවාගැනීම් පරිපාටිය පරිදි පහත සඳහන් තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ පූර්ණ කාලීන පදනම මත සේවය කිරීමට ව්‍යාපෘති කළමනාකරණ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

තනතුරු සඳහා වන වැටුප් අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ 03 වන වගුවේ 03 වන තීරුවේ සඳහන් කොට ඇත.

අයදුම්කරුවන් වයස අවුරුදු 62 ට අඩු විය යුතු අතර, ඉංග්‍රීසි බස හොඳින් හසුරුවා ගැනීමේ හැකියාව හා පරිගණක සාක්ෂරතාව අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතාවන් වේ. විදේශ අරමුදල් සපයන ලද ව්‍යාපෘතිවල ශ්‍රී ලංකාවේ වැඩ පළපුරුද්ද වැඩි වාසියක් ලෙස සැලකේ.

| අංකය | PS කාණ්ඩය | තනතුර | තනතුරු සංඛ්‍යාව | අදාළ වන චක්‍රලේඛය |
|---|---|---|---|---|
| 01 | PS 4A | ඉංජිනේරු (ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පිළිබඳ පළපුරුද්ද සඳහා ප්‍රමුඛතාවක් දෙනු ඇත) | 2 | MSD<br>චක්‍රලේඛ<br>අංක 01/2019 |
| 02 | PS 4B | ඉංජිනේරු (ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පිළිබඳ පළපුරුද්ද සඳහා ප්‍රමුඛතාවක් දෙනු ඇත) | 3 | |
| 03 | PS 5 | ගිණුම් නිලධාරී | 1 | |
| 04 | PS 5 | ජල කළමනාකරණ පද්ධති තාක්ෂණවේදී (තොරතුරු තාක්ෂණය/ විදුලි/ විද්‍යුත් පළපුරුද්ද සඳහා ප්‍රමුඛතාවක් දෙනු ඇත) | 1 | |
| 05 | PS 6A | ව්‍යාපෘති නිලධාරී/ සංවර්ධන නිලධාරී | 1 | |
| 06 | | කළමනාකරණ සහකාර | 2 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 06-2006 |
| 07 | | රියදුරන් (බර වාහන පැදවීමේ බලපත්‍රය සමග වසර තුනක (03) පළපුරුද්ද | 4 | |

ජීවදත්ත සමග ඥාතීන් නොවන නිර්දේශයකයින් දෙදෙනෙකුගේ නම් හා සම්බන්ධ කරගත හැකි විස්තර ඇතුළත් අයදුම්පත් මූලික සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග එය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කර 2024 ජූලි 11 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල් මඟින් පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතුය. රාජ්‍ය සේවයේ/ පළාත් පාලන ආයතන ඇතුළු පළාත් රාජ්‍ය සේවයේ/ රාජ්‍ය සංස්ථාවල/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල/ පූර්ණව රජය සතු සමාගම්වල සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

තවද, එම අයදුම්පත ඊමේල් විෂයය තීරුවේ අයදුම් කරන තනතුර සඳහන් කර ao.iwwrmp@gmail.com යන ඊමේල් මඟින් එවන මෙන් අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ, ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP),**
**2 වන මහල, මහවැලි කේන්ද්‍රය,**
**අංක 96, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07.**
**දුරකථන අංකය : 0112691163 වෙබ් අඩවිය www.iwwrmp.lk**

කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබේ. අනිසි බලපෑම් කිරීම අයදුම්පත් නුසුදුසු යැයි සලකනු ලබන අතර, එවැනි අයදුම්කරුවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය.**
**2024.07.04**